උඩුදුම්බර ප්‍රාදේශිය සභාව
මහනුවර දිස්ත්‍රික්කය

--------------------------------------

**1.** මූල්‍ය ප්‍රකාශන.

-----------------

**1.1** මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම.

------------------------------

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2014 අප්‍රේල් 16 දින ද, ඉකුත් වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2013 මැයි 23 දින ද විගණනයට ඉදිරිපත් කර තිබු අතර, සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2015 ජනවාරි 16 දින සභාවේ, සභාපතිවරයාට යවා ඇත.

**1.2** මතය.

-------

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2013 දෙසැම්බර් 31 දිනට උඩුදුම්බර ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.3** මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම.

---------------------------------------

**1.3.1** ගිණුම්කරණ ප්‍රතිපත්ති.

----------------------

වෙළඳ බලපත්‍ර ගාස්තු, කුළී හා ත්‍රීරෝද රථ ගාස්තු මුදල් පදනම මත ගිණුම් තබා තිබුණි.

**1.3.2 ගිණුම්කරණ අඩුපාඩු.**

**---------------------**

**පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.**

**(අ) ප්‍රාදේශීය සභාව එකතු කළ අගය මත බදු සදහා ලියාපදිංචි වී නොතිබිය දී, පරිසර බලපත්‍ර ගාස්තු අය කිරීමේ දි, එකතු කළ අගය මත රු.106,281 ක බදු මුදලක් අය කර තිබුණි.**

**(ආ) ගබඩා අත්තිකාරම් ගිණුම් ක්‍රමය අනුගමනය කිරීමකින් තොරව සමාලෝචිත වර්ෂයේ මිල දි ගෙන තිබුණු රු.28,500 ක් වටිනා ජල නළ උපාංග හා රු.252,194 ක් වටිනා ලිපි ද්‍රව්‍ය මුළු වියදම සමාලෝචිත වර්ෂයේ වියදමක් සේ ගිණුම්ගත කර තිබුණි.**

**(ඇ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු.313,000 ක බදු දේපළ කළින් ලද ආදායම රු.276,000 ක් ලෙස ගිණුම්ගත කිරීම හේතුවෙන්, රු.37,000 ක් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි.**

**(ඈ) විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව විසින් සභාවට ඉදිරිපත් කර තිබු බිල්පතට අනුව, සමාලෝචිත වර්ෂයේ හිග විශ්‍රාම වැටුප රු.599,677 ක් බව දක්වා තිබුණ ද, සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රයේ එම හිගය රු.589,488 ක් ලෙස රු.10,189 ක් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි.**

**(ඉ) ප්‍රාදේශීය සභාව වෙත අයිතිය පවරා ගෙන නොතිබු රු.2,051,250 ක් වු වාහන 04 ක වටිනාකම සමාලෝචිත වර්ෂයේ වාහන හා කරත්ත ගිණුමේ දක්වා තිබුණි.**

**1.3.3 නොසැසදු පාලන ගිණුම්.**

**-----------------------**

**ගිණුම් විෂයයන් 04 ක පාලන ගිණුම් අනුව, ශේෂයන්ගේ එකතුව රු.1,692,402 ක් වු අතර, අදාළ ලේඛන හා උප ලේඛන අනුව, එම ගිණුම් ශේෂයන්ගේ එකතුව රු.1,709,038 ක් වුයෙන්, රු.16,636 ක විචලනයක් නිරීක්ෂණය විය.**

**1.3.4 ලැබියයුතු හා ගෙවියයුතු ගිණුම්.**

**--------------------------------**

**(අ) ලැබියයුතු ගිණුම්.**

**-------------------**

**2013 දෙසැම්බර් 31 දිනට එකතුව රු.16,552,056 ක් වූ ලැබියයුතු ගිණුම් ශේෂවල වටිනාකමින් රු.3,492,754 ක මුදලක් අවුරුදු 01 ක කාලයක් ඉක්මවා තිබුණු ශේෂයක් විය.**

**(ආ) ගෙවියයුතු ගිණුම්.**

**------------------------**

**2013 දෙසැම්බර් 31 දිනට එකතුව රු.14,122,158 ක් වූ ගෙවියයුතු ගිණුම් ශේෂවල වටිනාකමින් රු.1,855,614 ක් අවුරුදු 01 ක කාලයක් ඉක්මවා තිබුණු ශේෂයක් විය.**

**1.3.5 නීති, රීති හා රෙගුලාසි ආදියට අනුකූල නොවීම.**

**----------------------------------------------**

**පහත සදහන් නීති, රිති හා රෙගුලාසිවලට අනුකූල නොවූ අවස්ථා නිරික්ෂණය විය.**

| නීති, රීති හා රෙගුලාසි යනාදියට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| **(අ) 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත.** | |
| (i) 158 වගන්තිය | **සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට පෙර වර්ෂවලට අදාළ හිග හිටි වරිපනම් බදු, අක්කර බදු හා ජල ගාස්තු එකතුව රු.1,363,001 ක හිග ශේෂයක් පැවතුණ ද, මුදල් ගෙවීම් පැහැර හරින්නන් සම්බන්ධයෙන් යොමුගත රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.** |

| | |
|---|---|
| **(ii)** **159** වගන්තිය | කඩ කුළී රු.**498,630** ක හිග ශේෂයක් පැවතුණ ද, එම මුදල් ගෙවීම පැහැර හරින්නන් සම්බන්ධයෙන් යොමුගත රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. |
| (ආ) ශ්‍රී ලංකා ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය මු.රෙ.**571** | **2009** සිට **2012** වර්ෂයන්ට අදාළ රු.**77,586** ක තැන්පතු නිරවුල් කිරීමට හෝ සුදුස්සක් කිරීමට කටයුතු කර නොතිබුණි. |

**2.** මූල්‍ය සමාලෝචනය.

---------------------

**2.1** මූල්‍ය ප්‍රතිඵල.

---------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, **2013** දෙසැම්බර් **31** දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.**1,230,230** ක් වූ අතර, ඊට අනුරූපිව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.**177,932** ක් වුයෙන්, මූල්‍ය ප්‍රතිඵලවල රු.**1,052,298** ක වර්ධනයක් දක්නට ලැබුණි.

**2.2** විග්‍රාහාත්මක මූල්‍ය සමාලෝචනය.

----------------------------------

එකතුව රු.**9,316,099** ක මුදලක් සමාලෝචිත වර්ෂයේ වැටුප් හා දීමනා, වශයෙන් සභාව ගෙවීම් කර තිබුණ ද, එයින් ප්‍රතිපූර්ණය කර ගෙන තිබුණේ රු.**9,042,615** ක මුදලක් වුවත්, ඉතිරි රු.**273,484** ක හිග වැටුප් ප්‍රතිපූර්ණ මුදල ලැබියයුතු ගිණුම් ලෙස පෙන්වීමට කටයුතු කර නොතිබුණි.

## 2.3 කාරක ප්‍රාග්ධන කළමනාකරණය.

---------------------------------

මුළු ජංගම වත්කම් සමග ජංගම වගකීම් අතර අනුපාතය 1.18:1 ක් වූ අතර, ඉකුත් වර්ෂයේ දි එය 1.02:1 ක් විය. මේ අනුව, මෙම අනුපාතයන් ප්‍රශස්ථ මට්ටමක නොපවතින බව නිරීක්ෂණය විය.

## 2.4 ආදායම් පරිපාලනය.

--------------------

### 2.4.1 ආදායම් රැස් කිරීමේ කාර්යය සාධනය.

------------------------------------

ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම්

------------------------------------------------------------

සභාපතිවරයා විසින් සමාලෝචිත වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම් පිළිබද තොරතුරු පහත දැක්වේ.

| ආදායම් විෂයය | ඇස්තමේන්තුගත | තථ්‍ය | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය |
|---|---|---|---|
| | රු. '000 | රු. '000 | රු. '000 |
| (i) වරිපනම් හා බදු | 163 | 96 | 328 |
| (ii) කුලී මුදල් | 1,377 | 1,290 | 503 |
| (iii) බලපත්‍ර ගාස්තු | 825 | 816 | -- |
| (iv) වෙනත් ආදායම් | 3,880 | 4,831 | 3,507 |

**2.4.2** වරිපනම් බදු

--------------

සමාලෝචිත වර්ෂයේ ආරම්භක දිනට රු.**117,679** ක හිගයක් පැවති අතර, වර්ෂයේ බිල් කිරීම්, රු.**77,618** ක් විය. වර්ෂයේ අය කිරීම් ප්‍රතිශතය හිගයෙන් සියයට **84** ක් හා බිල් කිරීම්වලින් සියයට **30.2** ක් වූ අතර, සමාලෝචිත වර්ෂය අවසාන දිනට රු.**149,736** ක මුදලක් අය වියයුතුව තිබුණි.

**2.4.3** වෙළඳ බලපත්‍ර ගාස්තු.

-----------------------

මූල්‍ය පදනම මත ගිණුම් තැබීම හේතුවෙන්, වර්ෂය ආරම්භයේ හෝ අවසානයේ හිග ගාස්තු හෙළිදරව් කර නොතිබුණි.

**2.4.4** ජල ගාස්තු.

---------------

සමාලෝචිත වර්ෂයේ ආරම්භක දිනට රු.**673,897** ක හිගයක් පැවති අතර, වර්ෂය තුළ බිල් කිරීම රු.**718,827** ක් විය. වර්ෂය තුළ අය කිරීම පිළිවෙළින් රු.**187,692** ක් හා රු.**70,410** ක් වූ අතර, එය ප්‍රතිශතයක් ලෙස පිළිවෙළින් සියයට **27.8** ක් හා සියයට **23.7** ක් විය. සමාලෝචිත වර්ෂය අවසාන දිනට රු.**1,034,622** ක මුදලක් අය වියයුතුව තිබූ අතර, මෙම ශේෂයෙන් **2014** දෙසැම්බර් **31** දින වන විටත් රු.**544,352** ක මුදලක් තවදුරටත් අය වියයුතුව පැවතුණි.

**2.4.5** අක්කර බදු.

-------------

සමාලෝචිත වර්ෂයේ ආරම්භක හිගය රු.**168,600** ක් වූ අතර, වර්ෂය තුළ බිල් කිරීම රු.**12,252** ක් විය. එම ආදායම්වලින් වර්ෂය තුළ අය කර ගැනීම පිළිවෙළින් රු.**557** ක් හා රු.**1,556** ක් වූ හෙයින්, බදු අය කිරීම ඉතාම දුර්වල මට්ටමක පවතින බව නිරීක්ෂණය වුණි.

**3.** **මෙහෙයුම් සමාලෝචනය.**

**--------------------------**

**3.1** **කළමනාකරණ අකාර්යක්ෂමතා.**

**--------------------------------**

**පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.**

**(අ)** **ඇප සුරැකුම් ලබා නොගෙන කරන ලද සැපයුම් හා සේවා වෙනුවෙන් දිගින් දිගටම අය නොවී පවතින ණය රු.89,000 ක් අය කර ගැනීමට කටයුතු කර නොතිබුණි.**

**(ආ)** **ව්‍යාපාරික අරමුණු මත මිල දී ගෙන සේවයේ යොදවා තිබූ ඩුප්ලෝ මුද්‍රණ යන්ත්‍රය හා ටිපර් රථය (CPLH – 4778) සඳහා වාර්ෂික ආදායම් වියදම් ගිණුමක් හා සමුච්චිත පිරිවැය ප්‍රතිලාභ දැක්වෙන ප්‍රකාශයක් පිළියෙළ කිරීමට කටයුතු කර නොතිබුණි.**

**(ඇ)** **සන්නිවේදන සමාගම් 05 කින් වසර 03 ත් 05 ත් අතර කාලයකට පෙර අනවසරයෙන් ඉදි කර තිබුණු සම්ප්‍රේෂණ කුළුණු 09 කින් සම්ප්‍රේෂණ පහසුකම් 15 ක් සපයා තිබුණ ද, අනවසර ඉදි කිරීම් වෙනුවෙන් 2013 නොවැම්බර් 21 දින වන විටත් ඒ සම්බන්ධයෙන් විධිමත් ක්‍රියාමාර්ගයක් අනුගමනය කර නොතිබුණි.**

**(ඈ)** **2012 හා 2013 වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ තුළින් හඳුනා ගෙන තිබූ වටිනාකම් සඳහන් නොවූ ලී බඩු හා සවි කිරීම් සහ යන්ත්‍ර හා උපකරණ විෂයයන් 78 කට අදාළ අයිතම 674 ක් හා රු.39,965 ක් වටිනා පුස්තකාල පොත් 356 ක ඌනතාව සම්බන්ධයෙන් වගකිවයුතු නිලධාරින්ගෙන් අය කිරීමට හෝ විධිමත් ක්‍රියාමාර්ගයක් අනුගමනය කිරීමට හෝ කටයුතු කර නොතිබුණි.**

**3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා.**

**--------------------------**

**පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.**

**(අ) සමාලෝචිත වර්ෂයට අදාළව වෙළඳ බලපත්‍ර ගාස්තු, කුළී හා ත්‍රී රෝද රථ ගාස්තු බිල් කිරීම වෙනුවෙන් පූර්වයෙන් සමීක්ෂණ පවත්වා වාර්තා ලබා ගෙන නොතිබුණි.**

**(ආ) සභාව සතු ජල ව්‍යාපෘති 03 මගින් ජල සැපයුම් ලබා දි තිබූ ස්ථාන 387 කින් 170 ක් සඳහා ජල මනු සවි කර නොතිබුණි. මේ හේතුවෙන්, සභාවේ ජල කළමනාකරණය හා ආදායම් උපයා ගැනීම දුර්වල මට්මටක පැවතුණි.**

**(ඇ) සන්නිවේදන සමාගම් 06 කින් ස්ථාන 06 ක ස්ථාපිත කර තිබූ සම්ප්‍රේෂණ කුළුණු සඳහා 2011 සිට 2013 දක්වා කාල පරිච්ඡේදය සඳහා රු.30,000 ක ව්‍යාපාර බදු අය කර නොතිබුණි.**

**(ඈ) රු.2,051,250 ක් වටිනා වාහන 04 ක් සහ වටිනාකම සඳහන්ව නොමැති වාහනය ඇතුළු වාහන 05 ක් සභාව වෙත පවරා ගෙන නොතිබුණි.**

**(ඉ) 2012 මාර්තු 29 දින පළාත් පාලන දෙපාර්තමේන්තුවෙන් ලැබී තිබූ අංක T-39305-11-TTI දරන වටිනාකම සඳහන් කර නොමැති ජල බවුසරය 2014 සැප්තැම්බර් 18 දින වන විටත් ලියාපදිංචිය සඳහා කටයුතු කර නොතිබුණි.**

**(ඊ) සභාව වෙත තිබූ වාහන 18 ක් සඳහා වාර්ෂික ආදායම් බලපත්‍ර ලබා ගෙන නොතිබුණි.**

**3.3 නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්.**

**-------------------------------------**

**වසරක් හෝ ඊට වැඩි කාලයක සිට වටිනාකම් හදුනාගත නොහැකි වාහනය හා රු.4,808,495 ක් වටිනා වාහන 10 ක් නිෂ්ක්‍රීයව පැවති බවත්, රු.297,000 ක් වටිනා වාහන 02 ක් ඌන උපයෝජිතව පැවති බව නිරීක්ෂණය විය.**

**3.4 කොන්ත්‍රාත් පරිපාලනය.**

**-------------------------**

**පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.**

**(අ) කිරිපට්ටිය ග්‍රාම නිලධාරී වසමේ කොස්වත්ත මාර්ගය 1:2:4 (3/4") මිශ්‍රණයෙන් 4 " ඝනකමට මාර්ගය මතුපිට කොන්ක්‍රීට් කිරීම සිදු කළයුතු වුව ද, මේ සම්බන්ධයෙන් අවස්ථා 06 ක දී සිදු කරන ලද භෞතික පරීක්ෂාවේ දී මාර්ගයේ ඝනකම 3½", 3¼ ", හා 3" ක ප්‍රමාණයෙන් ඉදි කර ඇති බවත් අනාවරණය විය. මේ අනුව, මාර්ගයේ ඉදි කිරීම් ඇස්තමේන්තුගත ප්‍රමිතියට අනුකූල වී නොතිබුණි.**

**(ආ) බඹරැද්ද මාර්ගයේ සිට පනියමලේ දක්වා දිවෙන මාර්ගය සංවර්ධනය කිරීමේ ඇස්තමේන්තුවේ වැඩ විෂයය අංක 02 ට අනුව, 1:2:4 (3/4") මිශ්‍රණයෙන් මතුපිට 5" ඝනකමට කොන්ක්‍රීට් කිරීම් කළයුතු වුව ද, භෞතික පරීක්ෂාවේ දී එහි ඝනකම 3½" හා 4¼" ක් වී තිබුණි. මේ අනුව, මාර්ගය ඇස්තමේන්තුගත ප්‍රමිතියට අනුකූලව ඉදි කර නොතිබුණි.**

**(ඇ) වැවල සිට පාසල දක්වා මාර්ගය සංවර්ධනය කිරීමේ ඇස්තමේන්තුවේ වැඩ විෂයය අංක 02 ට අදාළව, 1:2:4 (3/4") මිශ්‍රණයෙන් මාර්ගය 5" ඝනකමට කොන්ක්‍රීට් කිරීම් කළයුතු වුව ද, ඒ සම්බන්ධයෙන් සිදු කරන ලද භෞතික පරීක්ෂාවේ දී එහි ඝනකම 3½" හා 3" ක් බව අනාවරණය විය. මේ අනුව, ඇස්තමේන්තුගත ප්‍රමිතියට මාර්ගය ඉදි කර නොතිබුණි.**

**3.5 ව්‍යාපෘති ප්‍රමාද කිරිම.**

**------------------------**

**පහත සදහන් කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.**

**(අ) මැදිවක, පල්ලේවෙල ජල යෝජනා ක්‍රමය 2008 වර්ෂයේ දී, පමණ ආරම්භ වී 2011 වර්ෂය දක්වා ඉදි කිරීම් කටයුතු සිදු කර, එම කාල පරාසය**

තුළ රු.1,618,000 ක් වැය කර, එම ව්‍යාපෘතිය වැඩ අවසන් කිරීමට තවදුරටත් රු.4,000,000 ක් ඉක්මවූ මුදලක අවශ්‍යතාවය දක්වමින් ව්‍යාපෘතියේ වැඩ අතර මග නවතා දමා තිබුණි. මේ වන විට එහි සවි කිරීම් මළ කෑමට ලක්ව දිරා පත්වීමට ඉඩ හැර තිබුණි.

(ආ) රු.5,201,067 ක් වැය කර 2011 වර්ෂයේ ආරම්භ කළ මඩුගල්ල ප්‍රජා ජල ව්‍යාපෘතිය 2014 ජූනි 30 දින වන තෙක් සක්‍රීය කිරීමට හා ප්‍රතිලාභ ජනතාවට ලබා දීමට කටයුතු කර නොතිබුණි.

**3.6 සේවක මණ්ඩල කළමනාකරණය.**

-----------------------------------------

සභාවේ අනුමත කාර්යය මණ්ඩල තනතුරු 59 ක් පැවති අතර, එයින් 28 ක පුරප්පාඩු පැවතුණි. එකී පුරප්පාඩු තනතුරු සම්පූර්ණ කරවා ගැනීමට කටයුතු නොකර, අනියම් පදනම මත සේවකයින් 13 දෙනෙකු බඳවා ගෙන තිබුණි.

**4. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය.**

-----------------------------------------

**4.1 සංයුක්ත සැළැස්ම.**

------------------------

සමාලෝචිත වර්ෂයේ දි සභාවේ සංයුක්ත සැළැස්මක් පිළියෙළ කර නොතිබුණි.

**4.2 ප්‍රසම්පාදන සැළැස්ම.**

----------------------------

සභාව විසින් සමාලෝචිත වර්ෂයේ දි, රු.11,826,925 ක ප්‍රාග්ධන වියදමක් දරා තිබුණු නමුත්, ඒ සදහා ප්‍රසම්පාදන සැළැස්මක් සකස් කර නොතිබුණි.

**4.3 ක්‍රියාකාරී සැළැස්ම.**

------------------------

සමාලෝචිත වර්ෂයේ දි ක්‍රියාකාරී සැළැස්මක් සකස් කර නොතිබුණි.

**4.4 විගණන හා කළමනාකරණ කමිටු.**

**-----------------------------------**

**සමාලෝචිත වර්ෂයේ විගණන හා කළමනාකරණ කමිටු සාමාජිකයින් පත් කිරීමට හා රැස්වීම් පැවැත්වීමට කටයුතු කර නොතිබුණි.**

**4.5 අභ්‍යන්තර විගණනය.**

**-----------------------**

**සමාලෝචිත වර්ෂයේ දි සභාවේ ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් සිදු කර නොතිබුණි.**

**5. පද්ධති හා පාලනය.**

**-------------------**

**පහත සදහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කරනු ලැබේ.**

**(අ) ගිණුම්කරණය**

**(ආ) අභ්‍යන්තර පාලනය**

**(ඇ) ආදායම් පරිපාලනය**

**(ඈ) වත්කම්වල කළමනාකරණය**

**(ඉ) ණයගැති හා ණයහිමි පාලනය**

**(ඊ) තොග පාලනය**

**(උ) කොන්ත්‍රාත් පරිපාලනය**